විද්‍යාලය : ර/ ඇඹිලිපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ජී.එස්.එච්. ඇතුල්දූර
නිර්දේශිත ග්‍රන්ථය : පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

ප්‍රශ්නය : පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ඇසුරින් හෙළ සංස්කෘතියේ විවිධාංග පෝෂණය වූ ආකාරය නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

## පිළිතුර සඳහා මග පෙන්වීම :

★ හෙළ සංස්කෘතිය කෙරෙහි, 'ජාතක කතා' තරම් බලපෑ අවශේෂ වස්තු විෂයයක් නොමැති තරම්ය.

★ ග්‍රන්ථය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

★ ජාතක කතා ලිඛිත සම්ප්‍රදායක් මෙන් ම දේශනා කිරීමේ සම්ප්‍රදායක් වශයෙන් ද චිත්‍ර, මූර්ති ආදී කලා සම්ප්‍රදායක් වශයෙන් ද පැවති බවට පහත නිදසුන් ද ඇසුරු කරගනිමින් පහදන්න.

★ පරිවාර ජාතක සාහිත්‍ය - මෙයට ජාතක අටුවා, ගැටපද, සන්නස් ඇතුළත් වේ. (ජාතක අටුවා ගැටපදය, ජාතක කතා සන්නය, වෙසතුරු දා සන්නය, අටදා සන්නය, උමංදා ගැටපදය, දෙමළ ජාතක ගැටපදය නිදසුන් වේ.

★ සිංහල මහා කාව්‍ය - කව්සිළුමිණ, කාව්‍යශේඛරය

★ සිංහල පද්‍ය සාහිත්‍ය - ගුත්තිලය, සසදාවත, මුවදෙව්දාවත, කුස ජාතකය, සඳ කිඳුරු දා කව, දහම්සොඬ ජාතකය

★ සිංහල ගද්‍ය සාහිත්‍ය - අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, පූජාවලිය

★ දෘශ්‍ය කාව්‍ය (නාට්‍ය) - නූර්ති හා නාඩගම්, මනමේ, ලෝමහංස, වෙස්සන්තර, මහාසාර, පබාවතී, භවකඩතුරාව

★ චිත්‍ර හා මූර්ති - පන්සල් ආශ්‍රිත චිත්‍ර, චිත්‍ර කතා (වෙසක් තොරණ) හා මූර්ති

★ සිංහල ජන කවි - වෙස්සන්තර හෑල්ල, යසෝදරාවත

★ නූතන සාහිත්‍ය කෘති - විලාසිනියකගේ ප්‍රේමය (කණවේර ජාතකය)

★ සිංහල ජනවහර - සිංහල ජන පිරුළු හා ආප්තෝපදේශ (මිනිහා වෙස්සන්තර කෙනෙක් වෙලා, තලතා දේවියගේ නුවණ වගේ, ජූජක බමුණෙක්, දේවදත්තයෙක් )

ඇතුල්දූර